පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.22 පැය 1150 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1927/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**මාරක රිය අනතුරක් - පරයනාලන්කුලම් පොලිස් වසම.**

2025.10.22 වන අද දින අළුයම් කාලයේ පරයනාලන්කුලම් පොලිස් වසමේ මන්නාරම මැදවච්චිය ප්‍රධාන මාර්ගයේ කිලෝමීර් 35 කණුව සහ කිලෝමීටර් 36 කණුව අතර ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මන්නාරම දෙසට ධාවනය වෙමින් තිබූ පුද්ගලික බස් රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ අයිනෙහි තිබූ ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පිරිමි පුද්ගලයෙකු මිය ගොස් ඇති අතර තුවාල ලැබූ තවත් පිරිමි පුද්ගලයින් 08 දෙනෙකු හා කාන්තාවන් දෙදෙනෙකු මන්නාරම් හා වව්නියාව රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටී.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ ආසිකුලම්, මුරුන්කන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සෙට්ටිකුලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරුද තුවාල ලබා ප්‍රතිකාර ලබමින් සිටී. පරයනාලන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**